සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016
## 11 ශ්‍රේණිය සිංහල භාෂාව හා සාහිත්‍යය - I කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4 වරණවලින් නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන හෝ පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

01. එම ප්‍රදේශයේ දේශීය කර්මාන්ත සිදුවන්නේ **ඉබිගමනින්** යැයි ඇතැම්හු පවසති.
(1) දැඩි අසීරුවෙන් (2) ඉතා වේගයෙන්
(3) කිසිදු වෙනසක් නැතිව (4) ඉතා සෙමින්

02. ව්‍යාපෘති නියෝජිතයින් අතර පවත්නා **කඹ ඇදීම** හේතුවෙන් ගම්මු අසීරුවකට පත්වූහ.
(1) එකඟතාවයක් නැතිකම (2) රණ්ඩු සරුවල්
(3) අනවබෝධය (4) තරගය

03. පංතියේ **පණට පණ** මෙන් සිටි දෙමිතුරෝ නව නිර්මාණයක් බිහි කළහ.
(1) ඉතා දැහැමිව (2) ඉතා හිතවත්ව (3) නොවෙනස්ව (4) ඉතා සමීප වී

- **අංක 04 සිට 06 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. නිර්මාණයක් .................... කරන්නා, නිර්මාණකරුවා සමඟ අදහස් අතින් සමපාත වීමක් සිදුවෙතැයි අදහස් කෙරේ.
(1) සමීක්ෂණය (2) පරිශීලනය (3) සංසන්දනය (4) අධීක්ෂණය

05. එම ශාස්ත්‍රීය ලේඛන සමූහය අර්ථසම්පන්න ජීවිතයක .................... සිහිවටන වේ.
(1) තාවකාලික (2) ස්ථිර (3) ක්ෂණික (4) සදාතනික

06. මෙම විශාල තැන්පතුවේ බර හේතුවෙන් ඒවා එකිනෙකට .................... වී වැලි සමඟ එකතුවී ඇත.
(1) සංවෘත (2) විවෘත (3) සුසංගත (4) බිඳවැටී

07. අකාරාදි පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) උපක්‍රමය, ඓතිහාසික, වර්ණනා, ප්‍රකාශන
(2) විචිත්‍රවත්, නිසසල, ශේෂය, සම්භාවනා
(3) අන්තර්ගත, අතිශය, කල්පිතයක්, ගමනාන්තය
(4) ආයතනය, බාධාවක්, විවේචනය, සැලකිල්ලක්

08. අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ප්‍රවීණතාව, කතිකාවත, සෙබලා, මද්‍යසාර
(2) ස්ථරයක්, ඉක්මනින්, සමස්තලංකා, අර්බුදය
(3) ස්වාභාවික, නැණසර, සාතිශය, උද්ඝෝෂණ
(4) ශිෂ්ටාචාරය, රෝපණය, දෘෂ්ඨි කෝණය, සංතුෂ්ඨිය

09. දී ඇති පද පේළිවල ඇති පදවල දෙවෙනි අක්ෂරයෙහි අනුපිළිවෙළින් ඇලපිල්ල, පාපිල්ල, දීර්ඝ ඇදය, ඉස්පිල්ල යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) අතැඟිලි, පසුගාමී, කවාකාර, පරිහානිය

(2) සමාදානයෙන්, ගුරුත්වය, නෑදෑයෙක්, සැපින්නක්

(3) ග්‍රාමාරක්ෂක, මිශ්‍රණයක්, කැමැත්තක්, නීතිගරුක

(4) මායාකාරී, අනූදහසක්, සැදෑයෙන්, සතියක්

10. විභක්ති සමාසයට නිදසුන් **නොවන්නේ** කුමක් ද?

(1) මුහුද වැලි (2) වනමල් (3) සියපත (4) පොත්පිටු

11. උක්ත නාමපද දෙකක් හා අනුක්ත නාමපද දෙකක් ඇති පද පේළිය තෝරන්න.

(1) අතවැසියෝ, ඔවුන්, තාරකාවන්, වෙළෙන්දෙක්

(2) දරුවෙකු, ඇතමෙක්, තෝ, නායකයෝ

(3) රෝගීන්, ගොවීහු, සතෙකු, මවක

(4) මාහිමියෝ, ලේඛකයෙක්, වීරවරු, කවීන්

12. උපසර්ගයක් ඇතුළත් **නොවන** පදයක් ඇති පද පේළිය තෝරන්න.

(1) අත්‍යවශ්‍ය, අවගුණ, උවදෙස්, අනවසර

(2) අපිචර්ම, ආදේශය, දුස්සීල, නිශ්ශබ්ද

(3) අවතැන්, අමතර, නිස්සාර, ඉමහත්

(4) ප්‍රත්‍යුපකාර, පටිපාටිය, අධිචෝදනා, අකල්

13. 'නිලධාරීහු ගොවියන් කැඳවති.' මෙම වාක්‍යයෙහි ගොවියන් යන්නෙහි විභක්තිය කුමක් ද?

(1) අවධි (2) කර්තෘ (3) සම්බන්ධ (4) කර්ම

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

14. ශ්‍රී ලංකා භූමිසීමාව **අතික්‍රමණය** කළ එතුමා සමීප ඉන්දියාවේ පුරාවිද්‍යා ගවේෂණ කටයුතු කළේය.

(1) ඉක්මවායෑම (2) ක්‍රමානුකූලව (3) ඉතා වේගවත්ව (4) පියවරෙන් පියවරට

15. වානරයාගේ **ශීර්ෂකපාලය** ඇසුරු කරගෙන පුරාවිද්‍යාඥයෝ මානව ආරම්භයේ කාල නිර්ණය කරති.

(1) හිස් මුදුන (2) හිස්කබල (3) අස්ථි (4) හිස කෙස්

16. විවිධ ශබ්ද හා ශබ්ද සංයුති සඳහා **සම්මුතියකට** පැමිණීම භාෂාවේ උපත ලෙස සැලකේ.

(1) යෝජනාවකට (2) වෙනසකට (3) විවාදයකට (4) එකඟතාවයකට

17. මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) අසම්භාව්‍ය ක්‍රියා කරත, ගියොත්, බලද්දී, එද්දී

(2) කෘදන්ත රඟන, මැරූ, බලනා, ඔසවන

(3) සන්ධි අදිටන්, දළඟින්, ශිෂ්‍යාධාර, කිවිසුරු

(4) තද්ධිත ගුණවත්, පරාර්ථකාමී, ආදර්ශමත්, කාරුණික

18. එක් එක් පද පේළිවල මුලින් දී ඇති පදයට සමානාර්ථ පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) පැහැදුළ පැහැයෙන් බබළන, පවර උතුම්, රිටුන් රටවැසි, උදක ජලය

(2) දික්සගිය දීඝනිකාය, ප්‍රාචීන පෙරදිග, සාමග්‍රිය සමගිය, කිවිසුරු කවියට අධිපති

(3) අනලස් කම්මැලි, ලඹෝදර ගණදෙවියන්, ආපත්ති පැමිණීම, ක්ෂුධාවෙන් කුසගින්නෙන්

(4) විස්මයාවහ පුදුම උපදවන, සියත් බව උගත්බව, ප්‍රත්‍යක්ත තහවුරු, අතිශය බොහෝ සෙයින්

19. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොදෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) සතුරු රුපු, පිළිමල්, පසමිතුරු, අමිතුරු

(2) ආලෝකය අලු, ප්‍රභා, පහන්, කාන්තිය

(3) අනංගයා මදරද, වියොවග, පන්සිළු, මලවි

(4) විනීත දමුණු, සංයත, හික්මුණු, සංයම

20. විරුද්ධ අර්ථ පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) නූතන අධ්‍යතන (2) භාෂණ ලේඛන (3) සමීපස්ථ දූරස්ථ (4) සාවද්‍ය නිවරද්‍ය

21. දී ඇති වචන ගොනු අතුරින් අන්‍යෝන්‍ය වශයෙන් බැඳීමක් **නොමැති** වචනයක් සහිත පද පේළිය තෝරන්න.

(1) ඍජු, නිහතමානී, අසිරිමත්, තැන්පත්

(2) ප්‍රස්තාව පිරුළු, රූඪී, ආප්තෝපදේශ, මිශ්‍ර ක්‍රියා

(3) සැහැල්ලුව, කිරිකෝඩු, නඩේගුරා, කරුණා කරනවා

(4) නිති, ඉක්බිති, නිබඳ, යළි

22. පහත වගන්තියෙහි ඉරි ඇඳි පද අයත් ක්‍රියාපද වර්ග පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

'ඔහු දියට <u>පැන</u> මල් <u>කඩමින්</u> එහා මෙහි <u>පීනද්දී</u> කිඹුලෙක් පීනා <u>ආවේය.</u>'

(1) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා.

(2) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා.

(3) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා.

(4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා.

23. වැරදි අර්ථදැක්වීමක් සහිත වරණය තෝරන්න.

(1) විකල්පාර්ථයක් දැක්වෙන නිපාතවලින් වාක්‍ය සම්බන්ධ කිරීමේදී කර්තෘ පද දෙකම උක්ත ස්වරූපයෙන් තැබිය යුතුයි.

(2) උපමාවාචී නිපාත පදයකට පූර්වයේ යෙදෙන්නේ අනුක්ත නාම පදයකි.

(3) 'තොමෝ' යන පදය ප්‍රාණවාචී නාමපදයක් සමග යෙදුණ විට ක්‍රියා පදය බහු වචනයෙන් තැබිය යුතුය.

(4) 'හා', 'සහ' නිපාත සමග 'යන අර්ථය' පළ කිරීමේදී එම නිපාත සමග බැඳී නාම පදය අනුක්ත රූප ගනී.

24. සෑම පදයකම මූර්ධජ අකුරක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ටකය, ශුෂ්ක, ඒදණ්ඩ (2) පර්යේෂණ, කොළඹ, බිළිඳු

(3) වෙළඹ, බහුශ්‍රැත, අභරණ (4) නිමල, අසරණ, කිරණ

25. අධ්‍යාපන හෝ විනෝද චාරිකාවලදී යොදා ගැනෙන පහත සඳහන් ස්ථාන අතුරින් නිවැරදිව අකුරු ගැළපිය හැකි වරණය තෝරන්න.

(1) යංගිතිමුයන (2) යංමයගනහි (3) මලානිරිත්තය (4) රාධනු අපයර

- **අංක 26 හා 27 ප්‍රශ්නවල දී ඇති අදහසට ගැළපෙන ප්‍රස්ථාව පිරුළු තෝරන්න.**

26. අනවබෝධයෙන් යමක් කිරීම,

(1) පරංගියා කෝට්ටේ ගියා වගෙයි. (2) අබරා සිල්ගත්තා වගෙයි.

27. වැරදි දේ දැක දැක එම වැරදිවලට අනුබල දීම

(1) නියර මිටි තැනින් වතුර බහිනවා වගෙයි
(2) ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගෙයි
(3) කොට්වලිගය අල්ලා ගත්තා වගෙයි
(4) පනින රිළවුන්ට ඉනිමං බැන්දා වගෙයි

28. පහත සඳහන් උපභාෂා ව්‍යවහාරයන් නිවැරදිව ගළපා ඇති වරණය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| A. සබුක්කුව | B. බුඩා | C. අංකොළ මිටියා | D. අත්බරුව |
| E. වයසක තැනැත්තා | F. උදුල්ල | G. දඬුවම | H. වළහා |

(1) A, F
(2) C, G
(3) B, E
(4) D, H

- **අංක 29 හා 30 ප්‍රශ්නවල දී ඇති වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.**

29. (1) 'මගීහු මාර්ග නීති පිළිපදිති' යි පොලිස් නිලධාරීහු සිතුවෝය.
(2) අධ්‍යක්ෂ මණ්ඩලයේ කාන්තාවන් ඇත.
(3) ගොවියෝ සමග ගෙවිලියෝ ද කුඹුරු වපුරති.
(4) ළමයි හෝ ගුරුවරු චාරිකාවේ යෙදෙති.

30. (1) අපි යහපත් මිනිසුන් සේ හැසිරෙමු.
(2) මිනිස්සු අවංක නොවන්නේ ඇයි.
(3) සිසුන් තිදෙනෙක් විශිෂ්ට සම්මාන හිමිකරගත්හ.
(4) ශිෂ්‍ය නායකයෝ විසින් නායකත්වය දරන ලදහ.

31. පහත වාක්‍ය වල ඉරි ඇඳි පද වෙනුවට යොදාගත හැකි සමාන පද අනු පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

A. <u>වැඩිහිටි</u> පුද්ගලයින් දෙන අවවාද පිළිපැදීම බුද්ධිමත්කමේ ලක්ෂණයකි.
B. භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ වෙන්කළ <u>නොහැකි</u> බැඳීමකි.
C. <u>ඉදුණු</u> අඹගෙඩි බුදිමින් ගිරව් නද දෙති.
D. <u>අන්‍යයන්</u> ගේ සිතුවිලි ද එකතු කර වැඩ සටහන සැකසිය යුතුය.

(1) මෙරමා, විලික්සුණු, අවියෝජනීය, ආප්ත
(2) ආප්ත, අවියෝජනීය, විලික්සුණු, මෙරමා
(3) විලික්සුණු, මෙරමා, අවියෝජනීය, ආප්ත
(4) අවියෝජනීය, ආප්ත, මෙරමා, විලික්සුණු

32. 'එයාලා වැඩ කරනකොට අපිත් උදවු වුණා.' යන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදිව දැක්වෙන වාක්‍යය තෝරන්න.

(1) ඔවුන් වැඩ කරන විට අපිත් උදව් දුන්නෙමු.
(2) ඔවුහු වැඩ කරන විට අපිත් උදව් දුන්නෙමු.
(3) ඔවුන් වැඩ කරන විට අපිත් උදව් දුන්නෝය.
(4) ඔවුහු වැඩ කරන විට අපිත් උදව් දුන්නෝය.

33. පහත සඳහන් පද්‍යයෙහි ඉරි ඇඳි පදවල අර්ථය පිළිවෙළින් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

බලයුත් තුමුල මත වරණිඳු මෙදෙනැ' විස
දි වෙතත් සෙද තමන් සොඬ නොමැඩි විලස
ලදුවත් නැණැති දන මුළු ලොව ඉසුරු රැස
නොපනත් දෙයක් නොකෙරෙති තිසි දේම මිස

(1) නාගයා, විස මෙතරම් යැයි, ඉක්මනින්, නොගැළපෙන
(2) ශක්‍රයා, මදයෙන් කලබලයට පත්ව, වහා, නොගැළපෙන
(3) හස්තිරාජයා, මදයෙන් කලබලයට පත්ව, වහා, නොගැළපෙන
(4) හස්තිරාජයා, මේ විසවලින්, වහා, නොගැළපෙන

34. රූපකයක් සහිත වරණය තෝරන්න.
(1) රන්වන් වී කරලක් මෙන් බිමට නැමී ඉන්නේ
(2) උඹේ කැකිරි සිනාපොදක් මා වෙත හෙළමින්නේ
(3) අන්දකාර දුරුකරවන මැණික් පහන වැන්නේ
(4) සාරව මුළු පොළව එයින් ජීව ය උතුරන්ටයි

35. දැස, මුංපියලි, පුනරුත්පත්ති, දිනිඳු යන සන්ධි පද හතරට අදාළ සන්ධි නාම පිළිවෙළින් ගැළපෙන වරණය තෝරන්න.
(1) ගාත්‍රාක්ෂරලෝප සන්ධිය, ආගම සන්ධිය, පූර්වස්වරලෝප සන්ධිය, ස්වරාදේශ සන්ධිය
(2) ආගම සන්ධිය, පූර්වස්වරලෝප සන්ධිය, ස්වරාදේශ සන්ධිය, ගාත්‍රාක්ෂරලෝප සන්ධිය
(3) ස්වරාදේශ සන්ධිය, ගාත්‍රාක්ෂරලෝප සන්ධිය, ආගම සන්ධිය, පූර්වස්වරලෝප සන්ධිය
(4) පූර්වස්වරලෝප සන්ධිය, ගාත්‍රාක්ෂරලෝප සන්ධිය, ආගම සන්ධිය, ස්වරාදේශ සන්ධිය,

36. ''කත්තිරිනා පංචි දැමීම ඉවර කරන්නේ කුරු කරාඹු උකස් කොට ගන්නා සල්ලිත් පැරදුණ.''
''ගිය අවුරුද්දේ ඒ ගෑනි ගෙදර වත්තේ පොල් ගසුත් උකස්තියා සල්ලි අරගෙන පැරැද්දුවා.''
මෙම ගද්‍ය කොටස අයත් නවකතාව කුමක් ද?
(1) මීනා (2) හෙයියම්මාරුව (3) කරුමක්කාරයෝ (4) ගම්පෙරළිය

37. පහත සඳහන් නිසැඳැස් කාව්‍ය රචනා කළේ කවුද?

සිදා දියට එන්නට මට
බුද්ධිය උඹ තමයි එදා
පාර කියා දුන්නේ
ගමෙන් උරුම වූ වස්තුව
පොදියක් බැඳ කර තියාන
උඹේ බහට රැවටීලයි
සිදා දියට ආවේ

(1) මොනිකා රුවන් පතිරණ (2) ජී.බී. සේනානායක
(3) මහගම සේකර (4) චන්ද්‍රරත්න මානවසිංහ

38. හේන් ගොවිතැන ආශ්‍රිත ව්‍යවහාර වන 'වප්පන' යන වචනයෙහි තේරුම කුමක් ද?
(1) වැපිරූ ගොවිබිම් (2) ගසේ පැලට නගින ඉණිමඟ
(3) බිං හීය (4) අත්හැරදමූ හේන

39. පහත සඳහන් පද්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වගන්තිය ඇතුළත් වරණය තෝරන්න.

| | |
|---|---|
| දවස පුරා දිව වහළෙ’ව් උදය | වරා |
| අවර ඔරා පත් වර තරඟ තින් | දරා |
| සරත දුරා කැරු නහවනුව | සමුදුරා |
| සහසකරා කර ඇදි වැන්නැ තම | කරා |

(1) දවස පුරා වෙහෙසට පත්වූ උදසන වහළය ද සමුද්‍රය තරංග ද ගෙන සූර්යයාගේ වෙහෙස දුරු කර දිය නාවනු සඳහා රශ්මිය තමා කරා ඇදගන්නවාක් වැනිය.

(2) දවස පුරා වෙහෙසුණු සූර්යයා බටහිර අහසට පිවිසුණු විට සමුද්‍රය තම තරංග නැමැති අතින් උසුලා ගෙන සූර්යයාගේ වෙහෙස දුරු කර දිය නාවනු සඳහා රශ්මිය නැමැති අතින් තමන්කරා ඇද ගන්නා වැනිය.

(3) දවස පුරා වෙහෙසුණු සූර්යයාගේ වෙහෙස දුරුකර ගැනීමට සමුද්‍රය, සූර්යයා කරා ගමන් කරයි.

(4) උදය කාලයේ වහළයට වැටුණු වතුර දිවා කාලය සමුදුර කරා ගමන් කර තම වෙහෙස දුරු කර වෙහෙසට පත් අන් අයද තමා කෙරෙහි ඇද ගනී.

40. දී ඇති ඡේදයට වඩාත් සමීප අර්ථය දෙන වර්ණය තෝරන්න.

ක්‍රීඩා පිළිබඳ උද්යෝගය අපේ රටේ දිනෙන් දින ඉහළ යෑම හේතුවී ඇත්තේ ජාතික වශයෙන් හා අන්තර් ජාතික වශයෙන් අප ලබා ඇති ජයග්‍රහණ නිසාය. විවිධ ඉසව් ඔස්සේ ඉදිරියට යන අපේ ක්‍රීඩා සංවිධාන හේතු කොටගෙන ශාරීරික, මානසික හා සාමාජික වර්ධනයෙන් යුත් සමබර පෞරුෂයක් ඇති ජනකායක් බිහිවන බවට සැකයක් නැත. විශ්ව ග්‍රාමය ගැන කතා බහ කරන මේ සමයේ ක්‍රීඩා කෙරෙහිද අපේ අවධානය යොමු විය යුතුයි.

(1) ක්‍රීඩා පිළිබඳ උනන්දුව දූන් අපේ රටේ වැඩිය. ශාරීරික, මානසික හා සාමාජීය වර්ධනය නිසා අන්තර්ජාතික හා ජාතික ජයග්‍රහණ ක්‍රීඩා තුළින් ඇතිවේ. එමනිසා ක්‍රීඩාව ගැන අපේ අවධානය යොමු විය යුතුය.

(2) ක්‍රීඩා පිළිබඳ උද්යෝගය නිසා අපේ රටේ ජාතික හා අන්තර්ජාතික වශයෙන් ජයග්‍රහණ ලබා ඇත. මෙම ක්‍රීඩා සංවිධාන හේතු කරගෙන මිනිස් පෞරුෂ ඇති ජනකායක් බිහිවේ. විශ්ව ග්‍රාමය ගැන පමණක් නොව ක්‍රීඩා ගැනද අපේ අවධානය යොමු විය යුතුය.

(3) ක්‍රීඩා පිළිබඳ උද්යෝගය ඇතිවී ඇත්තේ ජාතික හා අන්තර් ජාතික ජයග්‍රහණ නිසාය. එමගින් සමබර පෞරුෂයකින් යුත් ජනකායක් බිහිවනු නිසැකය. විශ්ව ග්‍රාමය ගැන කතා කරන මෙවන් සමයක ක්‍රීඩාවට ද අවධානය යොමුවිය යුතුය.

(4) අපේ රටේ ක්‍රීඩා පිළිබඳව උද්යෝගය වැඩිවී ඇත. එසේම අන්තර්ජාතික හා ජාතික වශයෙන් ජයග්‍රහණ ද ලබා ඇත. ක්‍රීඩාව තුළින් සමබර පෞරුෂයක් ඇතිවේ. ඒ නිසා ක්‍රීඩාව කෙරෙහි අපේ අවධානය යොමුවිය යුතුය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

---

- **(i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) (i) පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කර නැවත ලියන්න.

(අ) සංගමයේ සාමාජිකයෝ බලාපොරොත්තු වන්නේ මොනවා ද?

(ආ) පයින් යන්නෝ මාර්ගයේ දකුණු පසින් යාම මැනවි.

(ii) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) අපරාධකරුවෝ අහිංසක මිනිසුන් මරති.

(ආ) අම්මා මගේ යහළුවන් ආදරයෙන් පිළිගත්තාය.

(iii) පහත දැක්වෙන 'අ' සහ 'ආ' යෙදුම්වල පළමු වචනය සමග දෙවෙනි වචනය නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවන වචනය හෝ සකස්කර ලියන්න.

(අ) සූර්ය මඩල

(ආ) ධර්ම දිවයින

(iv) පහත සඳහන් වචනවල අදහස පැහැදිළිවන සේ වාක්‍ය නිර්මාණය කරන්න.

(අ) කේන්ද්‍රස්ථානය

(ආ) නිර්මාණශීලිත්වය

(v) පහත සඳහන් පද්‍ය පාඨයේ යටින් ඉරි ඇඳි පදවල අර්ථය වෙන වෙනම ලියන්න.

<u>සතර දූරා</u> කැර නහවනුව      සමුදුරා
<u>සහසකරා</u> කර ඇදි වැන්නැ      තම කරා

(vi) පහත සඳහන් පාඨයේ අක්ෂර වින්‍යාසය වැරදි වචන නිවැරදි කර ලියන්න.

තම ඓෂ්වර්ය හා ශක්තිය පෙන්වීමටත් එම තත්ත්වය රැක ගැනීමටත් පූජකයන්ට දෑඪ සම්ප්‍රධායන්ගේ පිහිට සෙවීමට සිදුවිය.

(vii) පහත සඳහන් සන්ධිපද විසන්ධිකොට සන්ධි වර්ගය නම් කරන්න.

(අ) උපනූපන්

(ආ) මිණිබරණ

The National e-learning Portal for the General Education

(viii) (අ) පහත සඳහන් තද්ධිත පදවල ප්‍රත්‍ය වෙන්කර ලියන්න.

(i) ස්වර්ණමය

(ii) පාපතර

(ආ) පහත සඳහන් පදවල උපසර්ග පද වෙන්කොට ලියන්න.

(i) උන්මාද

(ii) සංකල්පනා

(ix) පහත වාක්‍යවල යටින් ඉරි ඇඳ පද කවර විභක්ති වලට අයත්දැයි නම් කරන්න.

(අ) සතුරෝ <u>ආයුධවලින්</u> පහර දෙමින් අහිංසක ජනතාව පීඩනයට පත්කරති.

(ආ) ඇත්තු රාත්‍රී කාලයට <u>කැලයෙහි</u> පමණක් නොව ගම්වලට පැමිණ වගා විනාශ කරති.

(x) පහත වාක්‍යයේ යටින් ඉරි ඇඳි පදය කුමන සමාස වර්ගයට අයත්දැයි නම් කරන්න.

(අ) වර්ෂා කාලයේ දී විශාල ලෙස අපතේ යන <u>වැසිජලය</u> ආරක්ෂා කර ගැනීම සඳහා විධිමත් සැළැස්මක් අප රටේ නැත.

(ආ) කමත් භාෂාවේදී භාවිතා කරන පහත සඳහන් වචන වල තේරුම ලියන්න.

(i) අටමගල

(ii) යාල්ලනවා

(ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ, උ යන විස්තර අතුරින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න. ඒ සඳහා සුදුසු මාතෘකාවක්ද යොදන්න.

(අ) වර්තමානයේ මාර්ගවල ධාවනයවන වාහන සංඛ්‍යාව දිනෙන් දිනම ඉහළයමින් පවතී. මේ නිසාම මාර්ගවල ගමනාගමනයේ යෙදෙන්නන්ට ගැටලු කිහිපයකට මුහුණ පාන්නට සිදු වී ඇත. රිය අනතුරු බහුල වීම හා මාර්ග තදබදය මේ අතර විශේෂයෙන් දක්නට ලැබේ. රිය අනතුරුවලට ප්‍රධානතම හේතුව නොසැලකිලිමත්කම හා අපරීක්ෂාකාරී ලෙස ධාවනයේ යෙදීමයි. මෙම රිය අනතුරු අද වනවිට දිනකට කිහිප දෙනෙකුගේ ජීවිත බිලිගන්නට සමත් වී ඇත. රියදුරන් පමණක් නොව පදිකයන් ද මාර්ගනීති නිවැරදිව පිළිපැදීමෙන් මේ තත්ත්වය අවමකර ගත හැකිය.

(ආ) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අද පවත්නා බරපතලම ගැටලුවකි වකුගඩු ආශ්‍රිත රෝගී තත්ත්වයන් බහුල වීම. ලංකාවේ උතුරු මැද, වයඹ පමණක් නොව අනෙක් ප්‍රදේශකරා ද අද මෙම රෝගය ව්‍යාප්ත වෙමින් පවතී. විවිධ පුද්ගලයින් මෙම රෝගයට හේතුව වශයෙන් විවිධ අදහස් හා මත ප්‍රකාශ කරන නමුදු එයට නිශ්චිත විසඳුමක් මේ වන විටත් ලබාදී නොමැති බව පෙනේ. සැම දෙනාගේම අපේක්ෂාව විය යුත්තේ වකුගඩු රෝගීන්ගෙන් තොර ශ්‍රී ලංකාවකි.

(ඉ) අතීත ශ්‍රී ලාංකික ශ්‍රී විභූතිය පිළිබඳව අපි ඉතාමත් ආශාවෙන් තවමත් කථාකරමු. එක් රජකු යටතේ

The National e-learning Portal for The General Education

සියල්ල සංවිධානය වී කෘෂිකර්මාන්තය දියුණු වී පරිසරය සුරක්ෂිත වීම අප ලැබූ ජයග්‍රහණයකි. නමුත් වර්තමානයේ මෙම තත්ත්වය ශීඝ්‍රයෙන් වෙනස්වී ඇත. පරිසරය සම්බන්ධව ඇමතිවරු කීපදෙනෙකි. අමාත්‍යාංශ රාශියකි. පරිසර, වනජීවී, වන සංරක්ෂණ, පතල් කැනීම්, භූ විද්‍යා යන අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හැරුණ විට ප්‍රාදේශීය සභා හා පළාත් සභා වලට ද මෙම විෂය පථය අයත් ය. නමුත් මේ වන විට ශ්‍රී ලංකාවේ ස්වාභාවික පරිසරය ගස්කැපීම්, වන විනාශ වීම්, අවනසර වැලිගොඩ දැමීම්, අනවසර පතල් කැනීම් නිසා දිනෙන් දිනම විනාශවෙමින් පවතී. මිනිසා රැකෙන්නේ පරිසරය රැකුණොත් පමණකි. මේ පිළිබඳව දැඩි අවධානය යොමුකළ යුතුය.

(ඊ) අද ලෝකයේ බොහෝ රටවල් මුහුණපාන ප්‍රධාන ගැටලුවකි ජලය හිඟකම. ස්වාභාවික සම්පතක් වන ජලය සුරැකීමට අපේ පැරැන්නෝ විවිධ ක්‍රම අනුගමනය කළහ. අද බොහෝ ප්‍රදේශවල ජනතාවට බීමට පවා ජලය නොමැතිය. මාර්ගයට බැස උද්සෝෂණ ව්‍යාපාරවල නිරත වීම ජනමාධ්‍ය මඟින් නිරතුරුව දැකිය හැකි දසුනකි. මෙම කරුණු අනුව අපට පෙනී යන්නේ ශ්‍රී ලංකාවද දිනෙන් දිනම උග්‍ර ජල හිඟයකට මුහුණ දෙමින් සිටින බවය. වගා විනාශ වීම, කෘෂි කර්මාන්ත කටයුතු වලට ජලය හිඟකම, වැව් සිඳීයාම. බීමට ජලය සොයා ගැනීමට සැතපුම් ගණනාවක් දුරගෙවා යාමට සිදුවීම එහි පෙර නිමිති කියාපායි. මේ නිසා මේ ගැටලුවට මුහුණ දීමට අප සූදානම් විය යුතුය.

(උ) නිරෝගී දිවියකට ක්‍රීඩාව අවශ්‍ය වේ. ජය පරාජයට වඩා ගුණධර්මවලින් පිරි සමබර පෞරුෂයකින් හෙබි සමාජයට හිතකර පූර්ණ පුරවැසියකු බිහිකිරීමට ක්‍රීඩාව උපයෝගී කරගත යුතුව ඇත. අද බොහෝ දෙනා ක්‍රීඩාව සඳහා පෙළඹෙන්නේ කරුණු කිහිපයක් මුල්කරගෙන බව පෙනේ. ජනප්‍රියත්වය, මුදල් හම්බකිරීම හා සමාජ බුහුමන් ලැබීම ඔවුන්ගේ අරමුණ බව පෙනේ. මේ සියල්ල ක්‍රීඩාවේ අරමුණුවලින් බැහැර වී ඇත. පාසල් අවධියේ සිටම දරුවන් ක්‍රීඩාව සඳහා යොමු කිරීම මඟින් මෙම දුර්වලතාවයන්ගෙන් ක්‍රීඩාව ගලවා ගත හැකිය.

(ලකුණු 25)

(03) පහත සඳහන් ඡේදය කියවා වචන 1/3 ක් වන සේ සාරාංශ කරන්න. (වචන 40 ක් වන සේ)

සිංහල සාහිත්‍යයේ වර්තමාන යුගය වනාහී යම් යම් කරුණු අතින් සලකන විට පැරණි යුගයන්ට වඩා විසිතුරු යැයි කිව හැකිය. අප සාහිත්‍යයෙහි දැන් සිදුවන්නේ පෙර ශතවර්ෂ විස්සක් මුලුල්ලෙහි සිදු නොවූ විරූ විපර්යාසයකි. අපේ පැරණි සාහිත්‍යය වැඩුණේ සංස්කෘත සාහිත්‍යයේ හා පාලි සාහිත්‍යයේ ආහාෂයෙනි. දැන් එය කෙරේ බලපාන්නේ අමුතු මුහුණුවර ඇති නා නා දෙසින් එන විවිධ අංශ වලින් යුත් සාහිත්‍ය විශේෂයි. එහෙයින් වර්තමාන ලේඛකයා තම ඥාන පිපාසය සංසිඳුවා ගැනීමට පැරණි සාහිත්‍ය උල්පත් කරා බෙහෙවින් නොයයි. ඔහුගේ නිර්මාණ ශක්තිය පැන නැගීමට මුල් හේතුව වනුයේ බටහිර සාහිත්‍යයෙන් ලැබෙන පෝෂණයයි. පෙර නොවූ විරූ සාහිත්‍යාංගයන් දැන් ඇතුළත් වීම වූ කලී අපේ වර්තමාන සාහිත්‍යයේ ඇති විශේෂ ලක්ෂණයකි. මෙකල පහළ වී ඇති ඉතා වැදගත් කෘති නිපදවූයේ බටහිර සාහිත්‍ය උද්‍යානයේ නිතර සංචාරය කොට එහි පිපී තිබෙන විසිතුරු පුෂ්ප වර්ගයන්ගේ සුවඳ බොහෝ සෙයින්ම ආඝ්‍රාණය කළ ලේඛකයන් බව කීම යුක්ති යුක්තය.

(ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පැරණි ලංකාවේ මෙන්ම ඉන්දියාවේත් තිබුණු ඉතා පැරණි දේශීය කාසි වර්ගය හැටියට දැනගන්නට තිබෙන්නේ 'පුරාණ' නමැති කාසියයි. ග්‍රේන් පනස් හයක සාමාන්‍ය බර ඇති ඍජුකෝණාස්‍රාකාර රිදී කැබැල්ලක් වූ මෙහි දෙපැත්තේම නොයෙක් විදියේ ලකුණු ඔබ්බා තිබුණේය.

මේවා රජතුමාගේ අවසරය ඇතිව වෙළඳ ශ්‍රේණි මගින් නිකුත් කරන්නට ඇතැයි සිතිය හැකිය. සංස්කෘත භාෂාවෙහි ''කර්ෂාපණ'' යනුවෙන්ද පාළියෙහි ''කහාපණ'' යනුවෙන්ද පැරණි බ්‍රාහ්මී ශිලා ලිපිවල ''කහවණු'' යනුවෙන්ද සඳහන් කරන ලද්දේ මේ කාසිය. පසු කාලයේ පැවැති මේ වර්ගයේ සමහර කාසි වටකුරු විය. මේවා යටත් පිරිසෙයින් ක්‍රි.ව. දෙවැනි ශත වර්ෂය දක්වාමත් භාවිතා කරන ලදී. ලංකාවේ තිබී සොයාගනු ලැබූ මේ වර්ගයේ ඇතැම් කාසි උතුරු ඉන්දියාවෙන් ගෙන්වන ලදැයි සිතිය හැකිය. එහෙත් සංකේත පිළියෙළ කර තිබෙන ආකාරයෙන් පෙනෙන්නේ සමහර කාසි ලංකාවේම සාදන ලද බවය. සලකුණු ඔබ්බවා තිබුණු කාසි ළගට ඇති වූයේ මුද්‍රා සහිත කාසිය. කලින් කල කාසි තුළ ඔබ්බනු ලැබූ සලකුණු මෙහිදී ඒකාබද්ධ කර ගන්නා ලදී. මුලදී මුද්‍ර යොදන ලද්දේ එක් පැත්තක පමණය. යටි පැත්ත හිස්ව තිබුණේය. නැතහොත් ලකුණු ඔබ්බවා තිබුණේ ය.

i. පැරණි ලංකාවේ හා ඉන්දියාවේ තිබුණ පැරණිම කාසි වර්ගය නම් කරන්න.

ii. එම කාසියේ තිබූ ලක්‍ෂණ තුනක් නම් කරන්න.

iii. මෙම ඡේදයේ සඳහන් වන පරිදි මෙම කාසි කවුරුන් විසින් නිකුත් කරන ලද්දේ ද?

iv. පැරණි කාසි හැඳින්වීමට මෙම ඡේදයේ යොදන ලද පර්යාය නම් මොනවා ද?

v. සලකුණු ඔබ්බා තිබූ කාසි වර්ගයට පසු හමු වූ කාසි වර්ගය කුමක් ද?

(ලකුණු 10)

(05) සාරගම එක්සත් කාන්තා සංගමය කෘෂිකර්ම අමාත්‍යංශයේ ද සහාය ඇතිව දේශීය බොජුන් සහිත අවන්හලක් ආරම්භ කොට ඇත. සාරගම වැව ඉස්මත්තේ පිහිටුවා ඇති මෙම දේශීය බොජුන් හලේ අලෙවිය සඳහා තබා ඇත්තේ කිසිදු රසකාරක අඩංගු නැති දේශීය නිෂ්පාදන වලින් සකසාගත් ආහාර වර්ග පමණකි. පැරණි ධාන්‍ය වර්ග මෙන්ම අතීතයේ නිෂ්පාදිත විවිධ ආහාර වර්ග රාශියකි. කෘමි නාශක, රසායනික පොහොර නොයෙදූ එළවලු, පළතුරු, ධාන්‍ය වර්ග රාශියක්ම මෙහි අලවියට තබා ඇත. මෙම වෙළඳ සැල පිළිබඳව අවට ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම සඳහා අත් පත්‍රිකාවක් පිළියෙළ කරන්න.

<u>නැතහොත්</u>

ගල්ගමුව දිවුල්ගස් වැව ප්‍රදේශයට නිරන්තරයෙන්ම මේ දිනවල වල් අලි තර්ජන පවතී. මේ වන විට ජීවිත හානිද කිහිපයක්ම සිදුවී ඇත. පාසල් දරුවන් උදෑසන පාසල් යන්නේ ජීවිත අවධානම ගැන නොසලකාය. කිලෝ මීටර් 15 ක දුරක් කැලයට සම්බන්ධ වී ඇති බැවින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවිත ආරක්ෂාකර ගැනීම සඳහා විදුලි වැටක් ලබාදෙන ලෙසත්, එය කඩිනමින් ඉඳිකර දෙන ලෙසත් ඉල්ලා දිවුල්ගස් වැව එක්සත් ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතා කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙත යැවීම සඳහා ලිපියක් සකස් කරන්න.

(ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## අවසාන වාර පරීක්ෂණය 2016
## 11 ශ්‍රේණිය සිංහල භාෂාව හා සාහිත්‍යය - III කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) 'අපට වැසිකිලියක්' කෙටිකතාව ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
(ආ) මෙම කෙටිකතා සංග්‍රහයෙහි කතුවරයා නම් කරන්න.

(ii) ''ඇයි අනේ මම හිතුවා ඔයා ඕකට සතුටු වෙයි කියලා.''
(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් කෙටිකතාව කුමක් ද?
(ආ) එම කෙටිකතාවේ පරිවර්තකයා කවුරුන් ද?

(iii) (අ) ''දෑතේ කරගැට සිඹ සනසන්නට'' පද්‍ය පන්තිය ඇතුළත් කාව්‍ය සංග්‍රහය කුමක් ද?
(ආ) මෙම පද්‍ය පන්තියම ''නොපළගීත'' කෘතියෙහි පළවූයේ කුමන නමකින් ද?

(iv) රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන
සන්නාලියන් කොහොම ඇන්දාද දේදුන්න
..............................................................................................
..............................................................................................
(අ) ඉහත පද්‍යයෙහි හිස්තැන් වලට නියමිත පද්‍ය පේළි ලියා දක්වන්න.
(ආ) ඉහත පද්‍ය උපුටාගත් කාව්‍ය සංග්‍රහය කුමක් ද?

(v) ''මැගේ මේ අභිමානය මැට වඩා සම්පත් ඇත්තන් ඇති හෙයින් සම්පතක් නිසා නොවෙයි.''
(අ) 'මැගේ' යනුවෙන් අදහස් කරන්නේ කවුරුන් ද?
(ආ) ඉහත ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?

(vi) (අ) හංස සන්දේශය රචනා කිරීමේ අරමුණ කුමක් ද?
(ආ) හංස සන්දේශය රචනා වූ යුගය නම් කරන්න.

(vii) ''දණ්ඩකින් පහරන ලද සර්පරාජයෙකු සේ කෝපයෙන් දිලිහි'' මෙහි (අ) උපමාව (ආ) උපමේය වෙන්කර දක්වන්න.

(viii) ''දෙව් මිනිසුන් විසින් පුදන ලද බුදුරජ බොහෝ කලක් ගිය කලැ මට වැඩ සඟහා මෙ මහ වලට වැඩි යැ''
(අ) මෙම ප්‍රකාශය උපුටාගත් කතා වස්තුව කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

(ix) නොමියන හේළි දහමක පණිවිඩය පිට
කොදුරම් කෙදිරියක් මුළු ලොව නිසල කොට

(අ) ඉහත පද්‍ය කොටස ඇතුළත් වන පද්‍ය පන්තිය කුමක් ද?

(ආ) මෙම පද්‍ය පන්තියෙන් ලබාදෙන ජීවන දර්ශනය කුමක් ද?

(x) සුර රද සමන් සමගින් සුරංගන එවර
පැහැනද මදාරා පරසතු මල් පතර
කැරපුද වඳින රැදි මුනි සිරිපා තඹර
සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර

(අ) මෙම පද්‍ය රචකයාගේ වෙනත් නිර්මාණ කෘති දෙකක් නම් කරන්න.

(ආ) මෙහි සඳහන් රූපකාර්ථවත් යෙදුම උපුටා ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියාව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) අද අසුවල්තැන ලැගුම් ගත්තාහ. අද වනාහි නුවරට එන්නාහයි පණ්ඩිතයන් වහන්සේට නිරන්තරයෙන් හසුන් එවන්නාහ. ඒ අසා බෝසතාණන් වහන්සේ වඩාලාම කළමනා විධානයෙහි නොපමා වූ එත්ලයි පරම්පරා ශබ්දයෙන් ඇසූහ.

(අ) මෙහි සඳහන් පණ්ඩිතයන් වහන්සේ තුළ පවත්නා ගුණාංග දෙකක් ලියන්න.

(ආ) අංකිත පදවල අරුත් ලියන්න.

(ii) පියසන් නොව බිඟුදූල් රැදි කොපුලී
අවසන් නොව වෙන නදටම කුහුලී
මදසන් සුන් පියොවින සිටි නොසැලී
ගජසෙන් සිතියම් ගජසිරි කියෙලී

(අ) මෙහි දැක්වෙන සත්ත්ව වර්ගයාගේ හැසිරීම කෙබඳු ද?

(ආ) අංකිත පදවල අරුත් ලියන්න.

(iii) ''මට මේ එක්කනාව අඳුනන්න බෑ' යි ඈ ගොතගසමින් පැවසුවාය. මොකක් හරි වැරදීමක් වෙලා වෙන්න ඇති.''

(අ) මෙම ප්‍රකාශය කරනු ලබන්නේ කුමන අවස්ථාවකද?

(ආ) මෙහි 'ඈ' යනු කවරෙක් ද? ''මේ එක්කනාව'' යනුවෙන් හඳුන්වන්නේ කවරෙක් ද?

(iv) තරකර ගලිනා ඇත දොර තදිනා
ඉවත දමා වෙරෙනා
මහ හෙණ හඬිනා පහරා සැණිනා
පෙරළම් බාහුවෙනා

(අ) මෙයින් ප්‍රකාශවන ආකාරයට සිංහබාහු සිදුකිරීමට යන්නේ කුමක් ද?

(ආ) අංකිත පදවල අරුත් ලියන්න.

(v) අනාගතය පිළිබඳ බියෙන් ඈ තැති ගැණින හය මාසය නියම වශයෙන්ම ගත වී ගියේ යැයි හැමදෙනාම පිළිගන්නා දවස එළඹියේ ය. එහෙත් බඹුන් නම් පැමිණියේ නැත. ඔහුට කිසියම් විපතක් සිද්ධ වෙන්නට ඇති. බාගවෙලාවට අසනීප වෙන්නට පුළුවනි.

(අ) මෙම පාඨය හා සම්බන්ධ සිද්ධිය කෙටියෙන් ලියන්න.

(ආ) මෙහි 'ඈ' යනු කවරෙක් ද? ඈ තුළ පැවති චරිත ලක්ෂණයක් සඳහන් කරන්න.

(ලකුණු 4 x 5 = 20)

(03) 'දියමන්තිමාලය' කෙටි කතාවේ මැටිල්ඩා දියමන්ති මාලය නැතිවීමට පෙර ජීවත් වූයේ,

(i) සිහිනලෝකයක ය.

(ii) පසුව ඇය ජීවත් වූයේ සැබෑ ලෝකයේ ය.

එක් කරුණකට නිදසුන් දෙකක් දක්වමින් මෙම කියමන සනාථ කරන්න.

**නැතහොත්**

අපට වැසිකිළියක් කෙටි කතාව රසවත් වීමට පහත කරුණු හේතු විය.

(i) සිද්ධි හා අවස්ථා නිරූපණය

(ii) යොදාගත් භාෂාව

එක් කරුණකට නිදසුන් දෙකක් දක්වමින් මෙම කියමන සත්‍ය දැයි විමසන්න.

(ලකුණු 15)

(04) රත්න ශ්‍රී විජේසිංහ මහතා 'වස්සානය' පද්‍ය පන්තිය නිර්මාණයෙහිලා,

(i) අපූර්ව කාව්‍යෝක්ති භාවිතයත්

(ii) අජීව වස්තු සජීවීකරණයත්

සඳහා උපක්‍රම භාවිත කොට ඇත. එක් කරුණකට නිදසුන් දෙකක් දක්වමින් පැහැදිළි කරන්න.

**නැතහොත්**

උග්ගසේන සිටුපුත්හුගේ කතා වස්තුව රසවත් වී ඇත්තේ,

(i) සාර්ථක උපමාව භාවිතය

(ii) හාස්‍ය හා උපහාසය දනවීම

යන කරුණු නිසාය. නිදසුන් දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

- **ප්‍රශ්න අංක 05, 06, 07 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

(05) මහෞෂධ පණ්ඩිතයන්ගේත්, කේවට්ට බමුණාගේත් චරිතය තුළ ඇති සමවිෂමතා නිදසුන් තුනක් දක්වමින් පැහැදිළි කරන්න.

(ලකුණු 10)

(06) ''වීණා වාදනයේ මිහිරියාව ධ්වනිතාර්ථවත් වන්නේ, අවට රැස් වූවන්ගේ ස්වභාවය වර්ණනා කිරීමෙනි.'' උදාහරණ තුනක් දක්වමින් මේ කියමන විමසන්න.

(ලකුණු 10)

(07) 'මුනි සිරිපා පද්‍ය පන්තිය' තුළින් පුද්ගල චරිත සංවර්ධනයට නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කරයි. මෙම කියමන සනාථ කරන්න.

(ලකුණු 10)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **අවසාන වාර පරීක්ෂණය 2016**

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය**

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(1) | 3 -(2) | 4 -(2) | 5 -(4) | 6 -(3) | 7 -(4) | 8 -(3) | 9 -(2) | 10 -(3) |
| 11-(1) | 12 -(3) | 13 -(4) | 14 -(1) | 15 -(2) | 16 -(4) | 17 -(3) | 18 -(2) | 19 -(3) | 20 -(1) |
| 21-(2) | 22 -(4) | 23 -(3) | 24 -(1) | 25 -(2) | 26 -(2) | 27 -(4) | 28 -(3) | 29 -(4) | 30 -(1) |
| 31-(2) | 32 -(1) | 33 -(3) | 34 -(2) | 35 -(3) | 36 -(4) | 37 -(3) | 38 -(1) | 39 -(2) | 40 -(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය

(01) i. (අ) සංගමයේ සාමාජිකයන් බලාපොරොත්තු වන්නේ මොනවා ද?
(ආ) පයින් යන්නන් මාර්ගයේ දකුණු පසින් යාම මැනවි.

ii. (අ) අපරාධකරුවන් විසින් අහිංසක මිනිස්සු මැරෙති / මරණු ලබති / මරනු ලබත්.
(ආ) අම්මා විසින් මගේ යහළුවෝ ආදරයෙන් පිළිගන්නා ලදහ. / ලද්දෝය. / ලැබුණෝය.

iii. (අ) සූර්ය මණ්ඩලය හිරු මඩල (ආ) ධර්ම ද්වීපය දහම් දිවයින

iv. (අ) ශ්‍රී ලංකාව ථේරවාදී බුදුදහමේ කේන්ද්‍රස්ථානය බවට පත් විය.
(ආ) තාක්ෂණ ශිල්පීන්ගේ නිර්මාණශීලීත්වය නිසා අද කොළඹ නගරය සිත්ගන්නා සුලු නගරයක් බවට පත්ව ඇත.

v. (අ) සතර දූරා වෙහෙස දුරුකර (ආ) සහසකරා හිරු / සූර්යයා

vi. (අ) ඓශ්වර්ය (ආ) සම්ප්‍රදායන්ගේ

vii (අ) උපන් + උපන් ස්වර සන්ධිය (ආ) මිණි + අබරණ පරස්වර ලෝප සන්ධිය

viii.(අ) (i) ස්වර + මය (ii) පාප + තර (ආ) (i) උන් + මාද (ii) සං + කල්පනා

ix. (අ) කරණ විභක්තිය (ආ) ආධාර විභක්තිය

x. (අ) අවධි විභක්ති සමාසය (ආ) (i) කමතේ ඇඳි යන්ත්‍රය (ii) කමතේ දී වී මැනීම

(02) රචනාව වචන 250 කට නො අඩු විය යුතුයි. පහත කරුණු සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න.

- අන්තර්ගතය මාතෘකාවට අදාල සාරවත් බව (ලකුණු 10)
- රචනා ශෛලිය සිත්ගන්නා සුලු අදහස් ප්‍රකාශනය (ලකුණු 05)
- සම්මත වියරණ රීති හා විනය උක්ත ආඛ්‍යාත සම්බන්ධය (ලකුණු 05)
- ශිල්පීය දක්‍ෂතාව (පද බෙදීම, ඡේද වෙන් කිරීම, විරාම ලක්‍ෂණ, අත් අකුරු) (ලකුණු 05)

(03) ඡේදයේ අදහස වචන හතලිහකින් පමණ ලිවීම.

පැරණි සාහිත්‍යය පෝෂණයට පාලි හා සංස්කෘත සාහිත්‍යය ඉවහල් විය. වර්තමාන සාහිත්‍යය අතීතයට වඩා සංකීර්ණ වී ඇත. වර්තමාන නිර්මාණකරුවා පෙරදිග මෙන්ම බටහිර සාහිත්‍යයේ ද ඇති විවිධ අංගයන්ගෙන් පෝෂණය ලබා තම වපසරිය වඩාත් පුලුල්කරගෙන ඇත.

(04) (i) පුරාණ කාසි

(ii) ඍජුකෝණාස්‍රාකාර වීම / ග්‍රේන් 56 ක බරක් තිබීම / රිදී කැබැල්ලක් වීම / දෙපැත්තේම නොයෙක් ලකුණු ඔබ්බවා තිබීම.

(iii) රජතුමාගේ අවසරයෙන් වෙළඳ ශ්‍රේණි විසින්

(iv) කර්ෂාපන / කහාපණ / කහවණු

(v) මුදු සහිත කාසි

05 පහත දැක්වෙනසේ ලකුණු ප්‍රදානය කරන්න.

- ආකෘතිය (ලකුණු 03)
- අන්තර්ගතය (ලකුණු 06)
- නිවැරදි වියරණ (ලකුණු 04)
- ශිල්පීය දක්ෂතා (ලකුණු 02)

## III පත්‍රය

01 (i) (අ) නොනිමි සිත්තම හා තවත් කෙටිකතා (ආ) කේ. ජයතිලක මහතා

(ii) (අ) දියමන්ති මාලය (ආ) කේ.ජී. කරුණාතිලක

(iii) (අ) ප්‍රබුද්ධ (ආ) ප්‍රාර්ථනා

(iv) (අ) වැහි වතුර ඉහිනවා නම් ඔවුන් විහිළුවට
කුරුල්ලෝ ඉගිල්ලී වරෙන් නුඹ මා ළඟට

(ආ) වස්සානය

(v) (අ) විද්දත් දූව (ආ) උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව

(vi) (අ) කැරගල වනරතන හිමියන් ලවා සමන්, විභීෂණ, උපුල්වන්, කඳ කුමරු යන දෙවිවරුන්ට පිරිත් කියා පිං දී සිරි පැරකුම්බා රජ කෙරෙහි කරුණාවෙන් සෙත සලසන ලෙස ඉල්ලීම.

(ආ) කෝට්ටේ යුගය

(vii) (අ) දණ්ඩකින් පහරන ලද සර්පයකු (ආ) කෝපයට පත් බ්‍රහ්මදත්ත රජු

(viii) (අ) අඟුල්මල් දමනය (ආ) අමාවතුර

(ix) (අ) ගංගාවේ සංගීතය (ආ) බාධක අභියෝගවලට මුහුණ දෙමින් ජීවිතය ගෙනයාම

(x) (අ) පරවි සන්දේශය / කාව්‍යශේඛරය / පංචිකාප්‍රදීපය / බුද්ධිප්පසාදිනිය (ආ) සිරිපා තඹර

(ලකුණු 2 x 10 = 20)

02 (i) (අ) නොපසුබට උත්සාහය / පරාර්ථකාමීත්වය / නිර්භීත බව

(ආ) • වඩාලාම මුල්තැනක් දී / වැඩි කොටම • පරම්පරා ශබ්දයෙන් කටින් කට පැතිරී ගිය කතා

(ii) (අ) • වීණා නාදය ඇසීමට බාධා වේවා යයි සිතා මී මැස්සෝ පියාපත් නොසොල්වා සිටීම. / • සිඳුණු මද සහිත ඇත් සේනාව නොසොල් වී අඳින ලද ඇත් රූප සේ සිටීම.

(ආ) කුහුලී කුතුහලය / පියොවින සාමාන්‍ය ස්වරූපයෙන්ම

(iii) (අ) වසර දහයකට පමණ පසුව මැටිල්ඩාට පොරෙස්ටියර් මහත්මිය හමු වී කතා කළ විට ඇයට මැටිල්ඩාව අඳුනාගන්න නොහැකි වූ අවස්ථාව.

(ආ) ''ඈ'' පොරෙස්ටියර්නෝනා / ''මේ එක්කනාව'' මැටිල්ඩා

(iv) (අ) තදින් වසා ඇති ගල්පුවරු දොර අතින් පෙරළා මවත්, නැගෙනියත් රැගෙන වංග දේශයට පිටව යාමටය.

(ආ) වෙරෙනා වීර්යය / සැණිනා වහා

(v) (අ) බබුන් සිරගත වුවායින් පසුව හරියාකාරව දින වකවානු හදා ගැනීමට නොහැකිව ගම්මු හා සමඟ සාකච්ඡා කොට නිවැරදි තීරණයකට එළඹීමට නොහැකි වූ පසු එකිනෙකා අතර සිදු වූ කතාබහා හා සම්බන්ධ සිද්ධිය වේ.

(ආ) ''ඈ'' පුංචි මැණිකා / දිරිය කාන්තාවක් වීම

(ලකුණු 4 x 5 = 20)

(03) (i) <u>මැටිල්ඩාගේ සිහිනලෝකය නිදසුන් :</u>

- ''තමා ඉපදී ඇත්තේ සියලුම සැප සම්පත් හා සුඛ විහරණ ආස්වාදනය කිරීමටය.''
- ''පෙරදිග මහාර්ඝ තිර රෙදි වලින් අලංකාරකන ලද.''.... යන කොටස හා සම්බන්ධ කොටස.
- ''අනර්ඝ කෞතුක වස්තූන්ගෙන් පිරුණා වූ සූක්ෂම කර්මාන්තයන්ගෙන් හෙබි ගෘහ භාණ්ඩ වලින් ද එල්ලන ලද පුරාණ සේද තිර රෙදි වලින්ද.....'' යන කොටස හා සම්බන්ධ කොටස.
- ''තම සාර්ථකත්වයත් රූප සෞන්දර්යයත් පිළිබඳ අභිමානයෙන් අන් කිසිවක් ගැන කල්පනාවක් නොමැතිව ආනන්ද ප්‍රවාහයක ගිලෙමින් හර්ෂෝන්මාදයෙන් නැටුවාය''

(ii) <u>පසුව ඇය ජීවත් වූයේ සැබෑ ලෝකයේය නිදසුන් :</u>

- ''අග හිඟකම් වලින් මිරිකුණු ජීවිතයක බියකරුකම ලොයිසල් මහත්මියට දැනෙන්නට විය. මුලසිටම ඈ තමාසතු කොටස නිර්භීතව හා වීරවත්ව ඉටු කළාය.''
- ''ඈ තෙල් සහිත හැළි වළන් ද වෙනත් මැටි බඳුන් ද, පිඟන් කෝප්ප හා දීසි පීරිසිද තම රෝස පැහැති නිය ගෙවී යනතුරු සේදුවාය.''
- ''දුප්පත් ගැහැනියක මෙන් ඇඳුම් පැළඳුම් කළ ඈ අතේ එල්ලාගත් මල්ලක් ඇතිව පළතුරු කුළුබඩු මස් ආදිය විකුණන වෙළෙන්දන් වෙත ගොස් සෑම තඹයක්ම ඉතිරි කරගැනීමේ බලාපොරොත්තුවෙන් ඔවුන් සමඟ කේවල් කරමින් සණ්ඩු දබර කරමින් නින්දා අපහාස වින්දාය.''

<u>නැතහොත්</u>

(i) <u>සිද්ධි හා අවස්ථා නිරූපණය :</u>

- කෙටි කතාකරුවා කෙටි කතාවට ප්‍රවේශ වන අවස්ථාව ''හෙට උදේට කුරහන් රොටී ටිකක් හදන්න කුරහන් ටික අඹරාගන්න උදවු වෙනවද මල්ලියෙ''
- මහජන සෞඛ්‍ය පරීක්ෂක ගමට පිවිසෙන අවස්ථාව ''අය්යෙ, අය්යෙ පොලිස්කාරයෙක් හදිස්සියේම හතිලමින් අප වෙත දුවගෙන ආ පොඩි මල්ලී දැත් වනමින් මට කතා කළේය.''
- වැසිකිළිය භාවිතය පිළිබඳ ඇති අනවබෝධය නිරූපනය කරන සිද්ධිය ''කුණු ඉස්පැක්ටර් තිකෝනිස්කාරයගේ ගෙදෙට්ට ගිහින් යන කොටස හා සම්බන්ධ කොටස....''
- වැසිකිළිය තැනීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා තර්ජනය කරන අවස්ථාව ''වළ කපන්න ගන්තෙත් නැතුවයි තවම නෑ ගෑවේ තව සුමාන දෙකකින් වැඩ ඉවර කරලා නොතිබුණොත් බලාගත හැකි කාටද වරදින්නෙ කියලා.''
- වැසිකිළිය සාදා නිමකළත් භාවිතයට නොගන්නා අවස්ථාව ''මල්ලිත් නංගිත් එය වෙනත් වැඩකට යොදා ගත්හ. එනම්, සෙල්ලම් බත් ඉවීමටත් සෙල්ලම් කඩ දැමීමටත්ය.''

(ii) <u>යොදාගත් භාෂාව :</u>

- <u>ගැමි වහර භාවිතය :</u>

''කුරහන් ටික අඹරගන්න උදවු වෙනවද මල්ලියෙ?''

''මා එයට එකඟවනතුරු හෝ ගෙදරින් පිටව යනතුරු හෝ <u>යාප්පු</u> වන්නට පටන් ගනී. ඇගේ

ඉල්ලීමකට මා එකඟ වන්නේ කලාතුරකිනි. වැඩිපුරම කරනනේ ගසාබසා දමා නැගිට යෑමය.''

- සංවාද භාවිතය :
  ''කවුද මේ ගෙදර ලොක්කා?''
  ''මම''
  ''මොකක්ද නම''
  ''හේරත්''
- උපමා භාවිතය :
  සුදු පාට වැස්සක් මෙන්
  වර්ෂාවක් වැස පායන්නාක් මෙන්
  ගෙදරට පුංචි පැටවකු ඇති වූවාක් මෙන්.
- සංස්කෘත වචන භාවිතය :
  චේතනා
  නෂ්ටාවශේෂ
  යක්ෂ දෝෂ
  පාණ්ඩු රෝගය

(ලකුණු 15)

(04) (i) අපූර්ව කාව්‍යෝක්ති භාවිතය :

- පද්‍ය සඳහා යොදාගෙන ඇති කියමන් :
  ''ඔය දෑල දොඩමලුය''
  ''නිල් වතුර තුරුලුකර''
  ''කුඹුක් අතු වතුර අතගගා''
  ''මල්වරම ඉල්මහට''
- රූපකාර්ථ යෙදුම් හා උපමා :
  ''ඔබෙ නයන නිල් පොකුණ''
  ''හිරු එළිය මවුකිරි වගේ''
- ප්‍රශ්නාර්ථ යෙදුම් :
  ''නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම් ද?
  ''දිය කෙළින පුංචි මාළුවෝ දුටුවාද?''
  ''නිල් කුරුලු බිලිඳු නිදි, ඇහැරවන්නේ කුමට?''
  ''සන්නාලියන් කොහොම ඇන්දාද දේදුන්න.''

(ii) අජීව වස්තු සජීවීකරණය සඳහා උපක්‍රම භාවිත කොට ඇත. :

''ඔය දෑල දොඩමලුය''
''නිල් වතුර තුරුලු කර''
''කෙකටියා පදුර සුදු මල් පොකුර වඩාගෙන.''
''කුඹුක් අතු වතුර අත ගගා නැමිලා දියට''
''හුලං දා ඔය කිමිද මල්වරම ඉල්මහට''
''වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින''
''ගිම්හානේ ගිලන් වී කෘශව සුදු මැලිව''

නැතහොත්

(i) උපමාව භාවිතය නිදසුන් :

- ''අවකප්පනයෙන් සැදු හසු රැන අල්වා ඇඳි ඇඳි සේ දුවන්නා සේ.''
- ''පැසුනු ගොයම් මුල් වූවාසේ''
- ''කරඟ රහත් වන්නාසේ.''
- ''පෙත්තක් මෙන්''
- ''සැට වස් ගිය මහතෙර කෙනෙකුන් වහන්සේ මෙන්.''

(ii) හාස්‍ය හා උපහාසය නිදසුන් :

- ''ලදොත් ජීවත් වෙමි නොලදොත් මියෙමි.''
- ''යාළුවාණන් ද කැඳවාලා මසු දහසක් දීලා තෙල් අහස සිට නැටු විද්දත් දුවගෙ පියාට දීලා තමාගේම දුවම පුතුන්ට පාවා දෙන්ට කියව''යි.
- දරුවා නැළවූ අවස්ථාව :
  ''ගැල් රකිනවුගේ පුත, බර උසුලනවුගේ පුත, කුමකුත් නොදනවුගේ පුතැ'යි කිය කියා නළවයි.''
  (ලකුණු නිදසුන් හතරකට ලකුණු 04 යි, සමස්තය පැහැදිලි කිරීමට ලකුණු 11 යි, මුළු ලකුණු 15 යි)

(05), (06), (07) ප්‍රශ්න සඳහා නිදසුන් තුනක් දක්වමින් ලියා ඇති සුදුසු පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

(ලකුණු නිදසුන් තුන සඳහා ලකුණු 03 යි, සමස්ත පැහැදිලි කිරීමට ලකුණු 04 යි, මුළු ලකුණු 10 යි.)